# ශිෂ්‍යත්ව විභාගය - 2015
## 5 ශ්‍රේණිය
## විභාග ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
අධ්‍යාපන අමාත්‍යාංශය

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ අවසරය මත ප්‍රසිද්ධ කරන ලදි.

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

5

**EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, AUGUST 2015**

**පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2015 අගෝස්තු**

# I පත්‍රය

**මිනිත්තු 45 යි.**

විභාග අංකය : ........................................

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්:**

- ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත ලියන්න.**
- **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **40**ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු **තුන** බැගින් දී ඇත. ඒවා අතුරෙන්, එක් එක් ප්‍රශ්නයට අදාළ **නිවැරදි පිළිතුර තෝරා ගෙන ඊට යටින් ඉරක් අඳින්න.**
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක** ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක** පළමු පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක** ඇගයීම කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක** අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය. | V/I/S/CH |



(2 වැනි පිටුව බලන්න


- අංක **1** සහ **2** ප්‍රශ්නවල මුලින් දී ඇති රූපය සම්පූර්ණ කිරීමට, ගැළපෙන කොටස තෝරන්න.

**1.**




(1) (2) (3)

**2.**



(1) (2) (3)

- රඹුටන් ගසක් රූපයේ දැක්වේ. ඒ ඇසුරෙන් අංක **3** සහ **4** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.





**3.** රාත්‍රි කාලයේ රඹුටන් කෑමට මෙම ගසට පැමිණෙන සතෙකි.

(1) බකමූණා (2) ඇට්කුකුළා (3) වවුලා

**4.** කඳෙහි A ස්ථානයේ බෙනයක් සෑදිය හැකි සහ පත්‍රවලින් B ස්ථානයේ ගොටුවක් සෑදිය හැකි සතුන් දෙදෙනකු පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) කොට්ටෝරුවා, දිමියා
(2) ගිරවා, දළඹුවා
(3) කොට්ටෝරුවා, දළඹුවා

**5.** එක ම මකුළු දැලක රූප 3 ක් පහත දී ඇත. ඊතලවලින් දැක්වෙන මාර්ග ඔස්සේ ගමන් කළ විට, කුඩා මකුළු පැටවකුට P සිට Q දක්වා යා හැකි **දුර වැඩි ම** මාර්ගය දැක්වෙන රූපය තෝරන්න.




(1) (2) (3)

විභාග අංකය ..................................

**6.** දී ඇති රූපයේ ? ලකුණ තිබෙන තීරුවේ තිබිය යුතු සංකේත කාණ්ඩය කුමක් ද?

| | | |
|---|---|---|
| ▲ | □ | |
| □ | △ | ? |
| △ | ▲ | |

(1) △ ▲ □  (2) △ □ ▲  (3) □ ▲ △

**7.** පහත දී ඇති වාක්‍ය අතුරෙන් නිවැරදි ව ලියා ඇති වාක්‍යය තෝරන්න.

(1) මළුවා ඇම ගිලීවි.
(2) මාළුවා ඇම ගිලීවි.
(3) මාළුව ඇම ගිලිවි.

**8.** 'අත්තනෝමතික' යන වචනයෙහි ඇති අකුරු මගින් සෑදිය හැකි වචනයකි.

(1) අනෝමා  (2) අත්තන  (3) කමත


**9.** දී ඇති ද්‍රව්‍ය යුගලවලින්, පළමුවැන්න භාවිත කිරීමට දෙවැන්න අත්‍යවශ්‍ය වන ද්‍රව්‍ය යුගලය අඩංගු පිළිතුර තෝරන්න.

(1) පොත - පෑන  (2) ඉදිකටුව - නූල  (3) කෝප්පය - පීරිසිය

**10.** 123, 234, 345, ......, 567
රටාව අනුව හිස්තැනට තිබිය යුතු සංඛ්‍යාව කුමක් ද?

(1) 456  (2) 468  (3) 678

**11.** පහත රූප සටහනේ රටාව අනුව, A හා B සඳහා තිබිය යුතු සංඛ්‍යා පිළිවෙළින් මොනවා ද?




(1) 4, 3
(2) 3, 2
(3) 3, 4

- පහත දී ඇති කොටුවේ සඳහන් සංකේත ඇසුරෙන් අංක **12** සහ **13** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| △ | = | උදව් | ● | = | හරිම |
| ✱ | = | ගොඩාක් | □ | = | කළාට |
| ▲ | = | මිහිරියි | ♦ | = | ස්තූතියි |
| ■ | = | ලස්සනයි | ല | = | ගීතය |
| ○ | = | ඔබේ | ✤ | = | කරුණාව |

**12.** ආචාරශීලි හැසිරීමකට අදාළ ප්‍රකාශයක් දැක්වෙන සංකේත පේළිය තෝරන්න.

(1) ○△■▲  (2) △□✱♦  (3) ○△●▲

**13.** අගය කිරීමේ ප්‍රකාශයක් දැක්වෙන සංකේත පේළිය තෝරන්න.

(1) ○ല✱♦  (2) ○✤✱■  (3) ○ല●▲

**14.** c, b, o යන ඉංග්‍රීසි අකුරු තුන මුහුණ බලන කණ්ණාඩියක් ඉදිරියෙන් ඇල්ලූ විට, ඉන් එක් අකුරක් වෙනත් ඉංග්‍රීසි අකුරක් ලෙස කණ්ණාඩිය තුළින් පෙනේ. එම අකුර කුමක් ද?

(1) c  (2) b  (3) o

(4 වැනි පිටුව බලන්න

**15.** සමමිති රේඛා දෙකක් පමණක් ඇති රූපය තෝරන්න.




(1) (2) (3)


**16.** පහත දී ඇති රූප තුනෙන් එක් රූපයක් අනෙක් රූප දෙකට වඩා වෙනස් ය. එම වෙනස් රූපය තෝරන්න.



(1) (2) (3)

**17.** X කඩදාසිය පිළිවෙළින් ①, ② සහ ③ යන තිත් ඉරි දිගේ තුන් වතාවක් නවනු ලැබේ. ඉන්පසු, තුන්වැනියට නවන ලද දාරය මැදින් Y රූපයේ දැක්වෙන ආකාරයට ත්‍රිකෝණාකාර කොටසක් කපා ඉවත් කර, කඩදාසිය දිගහැර බැලූ විට දක්නට ලැබෙන රූපය කුමක් ද?



(1) (2) (3)

**18.**  නම්,  ට .................. වේ.



(1) (2) (3)


**19.** පෙබරවාරි මාසයේ 5 වැනි දා බදාදා දිනයකි. එම මාසයට ඇති ඉරිදා දින ගණන කීය ද?

(1) 3 (2) 4 (3) 5

**20.** කකුල් තුනේ මේසයක් වටේ කකුල් හතරේ පුටු හතරක් ඇත. කකුල්වල මුළු එකතුව කීය ද?

(1) 16 (2) 19 (3) 20

**21.** ජල භාජනයක පතුලේ කාසියක් ඇත. ජල පෘෂ්ඨයට ඉහළින් බැලූ විට කාසිය පෙනෙන A ස්ථානය නිවැරදි ව දැක්වෙන රූපය තෝරන්න.




(1) (2) (3)




(5 වැනි පිටුව බලන්න

22. පා පැදියක් මිල දී ගැනීමට රු. 8500ක් අවශ්‍ය විය. මා ළඟ තිබුණේ රු. 4800කි. ඉතිරිය මිතුරන් දෙදෙනකුගෙන් ලබා ගතිමි. ලබා ගත් මුදල් විය හැක්කේ,

(1) රු. 2400 හා රු. 1300 ය.
(2) රු. 2500 හා රු. 2300 ය.
(3) රු. 5200 හා රු. 3300 ය.

23. රූපයේ ඇති සෑම කුඩා කොටුවක ම දිග හා පළල සමාන වේ.
රූපයේ ඇති මුළු සමචතුරස්‍ර ගණන කීය ද?



(1) 12
(2) 15
(3) 17

24. බසයක ගමන් කළ ශිෂ්‍යයකු තම ගමන් වියදම ගන්නා ලෙසට රු. 20ක් කොන්දොස්තර මහතාට දුන් විට, කොන්දොස්තර මහතා ශිෂ්‍යයාගෙන් තවත් රු. 2ක් ඉල්ලා ගෙන රු. 10ක් ඉතිරිය ලෙස දුන්නේ ය. බස් ගාස්තුව කීය ද?

(1) රු. 10 (2) රු. 12 (3) රු. 14

25. සන්ධ්‍යා කාලයේ දී උතුරු මැද සහ නැගෙනහිර පළාත්වල තැනින් තැන ගිගුරුම් සහිත වැසි ඇති විය හැකි බව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව නිවේදනය කර සිටී.
මෙම නිවේදනය අනුව, වැසි ඇති විය හැකි නගර දෙකක් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) වවුනියාව, මඩකලපුව
(2) පොළොන්නරුව, කතරගම
(3) අනුරාධපුරය, අම්පාර

26. ඔරලෝසුවක පැය කටුවත් මිනිත්තු කටුවත් අතර කෝණය සෘජු කෝණයකට වඩා අඩු අවස්ථාවක් පෙන්වන්නේ පහත සඳහන් කුමන වේලාවේ දී ද?

(1) පෙ.ව. 9.30 (2) ප.ව. 12.15 (3) ප.ව. 3.40

27. ශ්‍රී ලංකාවේ ඇති දියඇලි අතුරෙන් දියලුම ඇල්ල, දුන්හිඳ ඇල්ලට වඩා උස ය.
ලක්ෂපාන ඇල්ල, දියලුම ඇල්ලට වඩා උස ය.
මෙම දියඇලි තුනෙන් උස අඩු ම හා වැඩි ම දියඇලි දෙක පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) දියලුම, දුන්හිඳ
(2) දුන්හිඳ, දියලුම
(3) දුන්හිඳ, ලක්ෂපාන

28. 100 සිට 110 තෙක් සංඛ්‍යා ලිවීමේ දී '0' ලියවෙන වාර ගණන,

(1) 9 කි. (2) 10 කි. (3) 12 කි.


29. ළමයකු වයස අවුරුදු 10 හා 16 වන විට ප්‍රසිද්ධ විභාග දෙකකට ඉදිරිපත් විය යුතු ය. ගීතානි, නිලානිට වඩා අවුරුදු පහකින් වැඩිමහල් ය. ගීතානි පළමුවැනි විභාගයට ඉදිරිපත් වන්නේ 2017 වර්ෂයේ දී නම්, නිලානි දෙවැනි විභාගයට ඉදිරිපත් විය යුතු වර්ෂය කුමක් ද?

(1) 2022 (2) 2028 · (3) 2032




(6 වැනි පිටුව බලන්න

**30.** A හා B ත්‍රිකෝණ දෙක කඩදාසියකින් කපා ගෙන ඇත. A ත්‍රිකෝණය මත B ත්‍රිකෝණය තැබූ විට ලැබිය හැකි හැඩයක් දැක්වෙන රූපය කුමක් ද?





(1)


(2)


(3)

**31.** මම පිරිමියෙක් වෙමි. ගුණදාසගේ පුතා මගේ බාප්පා නම්, ගුණදාස හා මා අතර ඇති ඥාති සම්බන්ධය කුමක් ද?

(1) ගුණදාස මගේ සීයා ය.
(2) ගුණදාස මගේ මාමා ය.
(3) ගුණදාස මගේ පියා ය.

**32.** 4 හා 5 යන සංඛ්‍යා දෙකෙන් ම ඉතිරි නැතිව බෙදෙන, 25 ත් 75 ත් අතර ඇති සංඛ්‍යා ගණන කීය ද?


(1) 2 (2) 4 (3) 5


**33.** නිවසක රූපවාහිනිය ප.ව. 1.00 සිට ප.ව. 3.15 දක්වා ද පරිගණකය ප.ව. 2.15 සිට ප.ව. 3.30 දක්වා ද විදුලිපංකාව ප.ව. 2.30 සිට ප.ව. 3.45 දක්වා ද ක්‍රියාත්මක වුණි.


විදුලි උපකරණ තුන ම එක විට ක්‍රියාත්මක වූ කාලය

(1) මිනිත්තු 45 යි.
(2) පැය 1 යි.
(3) පැය 1 යි මිනිත්තු 15 යි.

**34.** පහත දී ඇති රූප තුනෙහි කුඩා කොටු සියල්ල ම සමාන ය. එම රූපවල ඇති තිත් ඉරි දිගේ නැවීමෙන් ඝනකයක් සාදා ගත හැකි වන්නේ කුමන රූපය මගින් ද?


(1)


(2)


(3)


**35.** □ × □ = △ ද
△ + △ = ○ ද
○ × ○ = 64 ද නම්, □ + △ + ○ හි අගය කුමක් ද?

(1) 4 (2) 8 (3) 14



(7 වැනි පිටුව බලන්න

**36.**



ඉහත රූපය අනුව, පහත සඳහන් කුමන ප්‍රකාශය නිවැරදි ද?

(1) වෘත්ත ගණන, ත්‍රිකෝණ ගණනට සමාන වේ.
(2) සෘජුකෝණාස්‍ර ගණන, වෘත්ත ගණන මෙන් දෙගුණයක් වේ.
(3) සෘජුකෝණාස්‍ර ගණන හතක් වේ.

**37.** වෛද්‍යවරයෙක් රෝගියකුට බෙහෙත් වර්ගයක් බීම සඳහා පහත සඳහන් උපදේශය දී ඇත.

"එක් වරකට පෙති 2 බැගින් දිනකට 3 වරක් (කෑමට පසු) ගන්න."

රෝගියාට බෙහෙත් පෙති 50ක් දී තිබේ. පළමු බෙහෙත් වේල උදේ කෑමට පසු ගත්තේ නම්, එම පෙති ගණන **සම්පූර්ණ දින** කීයකට ප්‍රමාණවත් වේ ද?

(1) 8 (2) 9 (3) 25


**38.**

52 84
.... ....

කොටුව තුළ හිස්තැන් දෙකට එන සංඛ්‍යා දෙකෙන් එකක්, අනෙක මෙන් තුන් ගුණයක් වන අතර, එම සංඛ්‍යා හතරේ එකතුව 200 වේ. හිස්තැන්වල තිබිය යුතු සංඛ්‍යා මොනවා ද?


(1) 16, 48 (2) 18, 54 (3) 19, 57

**39.** පහත සඳහන් රූපවල ඇති සංඛ්‍යා රටාව හඳුනාගෙන හිස්තැනට සුදුසු සංඛ්‍යාව තෝරන්න.




(1) 12
(2) 60
(3) 72

**40.** රතු, නිල්, තැඹිලි, කහ, සුදු යන පාටවලින් යුක්ත තීරු පහකින් සමන්විත කොඩියක් රූපයේ දී ඇත.




- කොඩියේ 4 වන තීරුව සුදු පාට ය.
- රතු පාට තීරුවේ සිට ඇති තුන්වැනි තීරුව නිල් පාට ය.
- තැඹිලි පාට තීරුව හා කහ පාට තීරුව එක ළඟ පිහිටා නැත.

මේ අනුව, 1 හා 5 තීරුවලට තිබිය හැකි පාට අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) කහ, නිල් (2) තැඹිලි, නිල් (3) රතු, තැඹිලි

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**5**

**EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, AUGUST 2015**

**පාසල්වලට සිසුන් තෝරා ගැනීම සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2015 අගෝස්තු**

# II පත්‍රය

**පැය 1 යි මිනිත්තු 15 යි.**

**විභාග අංකය :** ..............................

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් :**

* ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
* **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබගේ **විභාග අංකය** ලියන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **60**ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න. (සමහර ප්‍රශ්නවල අනුකොටස් ද ඇත.)
* පිළිතුරු ලියන්නට දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු **තිත් ඉරි මත** ලියන්න.
* පිළිතුරට යටින් ඉරක් අඳින්න කියා ඇති විට **ඉරක් පමණක් අඳින්න.**
* පිළිතුරු හතරක් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරා ගෙන ඊට යටින් ඉරක් අඳින්න.**
* කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| **02** | |
| **03** | |
| **04** | |
| **05** | |
| **06** | |
| **07** | |
| **08** | |
| **එකතුව** | |
| **අවසාන ලකුණ** | |
| **ඉලක්කමෙන්** | |
| **අකුරෙන්** | |

| | **කේත අන්සන හා සංකේත අංකය** |
|---|---|
| **පළමු පරීක්ෂක** ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම කළ බව සහතික කරමි. | |
| | V/II/S |
| **දෙවන පරීක්ෂක** පළමු පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කරමි. | |
| | V/II/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක** ඇගයීම කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | |
| | V/II/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක** අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය. | |
| | V/II/S/CH |



[2 වැනි පිටුව බලන්න.

**1.** පහත දැක්වෙන ඡේදය හොඳින් කියවන්න.

දවල් ඉර අව්ව වනය මත වැටී ගියාට පසු, ගස් මුදුන්වල සුළඟ හැපීමෙන් ඇති වන හඬ හා වියළි අතු එකිනෙක ගැටීමෙන් නඟින හඬත් හැර අන් කිසිම ශබ්දයක් වන ගැබ තුළින් අසන්නට නොලැබේ. එහෙත් වන සත්තු, ගස් යට පඳුරු අතර රිංගමින් එබිකම් පාමින් ඉතා සන්සුන් ව සේයාවන් මෙන් ඔබ මොබ හැසිරෙති.

ප්‍රශ්නවලට පිළිතුරු ඡේදයෙන් ම තෝරා ගෙන, **තිත් ඉරි මත ලියන්න.**

(i) ඡේදයෙන් කියවෙන්නේ කුමක් පිළිබඳ ව ද?

: ..............................................................................

(ii) වියළි අතු මගින් හඬ ඇති වන්නේ කෙසේ ද?

: ..............................................................................

(iii) ප්‍රාණවාචී බහුවචන නාම පදයක් ඡේදයෙන් ම සොයා ලියන්න.

: ..............................................................................

(iv) "ඉස්පිල්ල හා ඇලපිල්ල" යන දෙක ම පිළිවෙළින් යෙදී ඇති වචනය ඡේදයෙන් උපුටා ගෙන ලියන්න.

: ..............................................................................

(v) "එහා මෙහා" යන්නෙහි අදහසට සමාන අදහස දෙන පදය ඡේදයෙන් උපුටා ගෙන ලියන්න.

: ..............................................................................

(vi) ඡේදයෙහි සඳහන් උපමාව ලියන්න. : ..............................................................................

..............................................................................

**2.** පහත සඳහන් වාක්‍යවල හිස්තැනට අදාළ නිවැරදි වචනය වරහන් තුළින් තෝරා ගෙන **ඊට යටින් ඉරක් අඳින්න.**

(i) ශබ්ද .................... (විකාශන / විකාශණ) යන්ත්‍රය නැවත ක්‍රියාත්මක විය.

(ii) හුරුපුරුදු තේමා වාදනයක් .................... (ඇසිනි / ඇසිණි).

**3.** පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු ක්‍රියා පදය වරහන් තුළින් තෝරා ගෙන **ඊට යටින් ඉරක් අඳින්න.**

(i) අපි නියර දිගේ ........... (යමි / යමු).

(ii) ඔවුහු දැඩි උනන්දුවකින් වැඩ .............. (කළේ ය / කළෝ ය).

(iii) ගුරුතුමිය කඩිසර ගමනින් පන්තියට .............. ( පැමිණියා ය / පැමිණියේ ය).

**4.** පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා ගෙන **ඊට යටින් ඉරක් අඳින්න.**

(i) 'මතුර වල' යන පද පෙරළිය ලිහූ විට ලැබෙන්නේ ........... (වතුර මල / වතුර වල) යන්න ය.

(ii) "අක්කා **නැවුම්** කළයට ගෙනා වතුර සිසිල් ය." මෙම වාක්‍යයේ තද කළු අකුරෙන් ඇති වචනයේ අදහස .............. (පිරිසිදු / අලුත්) යන්න ය.

**5.** පහත සඳහන් පද්‍යයේ ඇති **හිස්තැන සම්පූර්ණ කරන්න.**

බීමට එක කිරි උගුරක්
කෑමට නිසි රස අහරක්
..........................................
අනේ පුතේ විඳින දුකක්

[3 වැනි පිටුව බලන්න.

විභාග අංකය : ..............................

6. පහත සඳහන් පද්‍යය කියවා, අසා ඇති ප්‍රශ්නයට පිළිතුර **හිස් ඉර මත ලියන්න.**

මා පිය සහ ගුරු
නැදෑ සොහොවුරු
හැමට ම කීකරු
සැපතෙකි මේ දරු

මෙහි සඳහන් දරුවාගේ හොඳ ගතිගුණය කුමක් ද?

..............................................................................................

7. 'නැත' යන අර්ථය හැඟවෙන ලෙස, පහත දී ඇති යෙදුම තනි වචනයෙන් ලියන්න.

'නෙමෙයි' : ..............................................................

8. පහත දී ඇති අදහස ප්‍රකාශ කෙරෙන **තනි වචනය,** ඉදිරියේ ඇති **හිස් ඉර මත ලියන්න.**

ගඟක් මුහුදට වැටෙන ස්ථානය : ..............................................................


9. පහත සඳහන් වචන ගළපා අර්ථවත් **වාක්‍යයක්** ලියන්න.

සමීප / පරිසරය / හා / තිබෙන්නේ / මිනිසා / සම්බන්ධයකි / අතර / ඉතා

..............................................................................................

..............................................................................................

10. දී ඇති ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.




හරහට
1. "මිල කළ නොහැකි" යන අර්ථය දෙයි.
3. ප්‍රධාන දිශාවලින් එකකි.

පහළට
2. පොළොවෙන් ලබා ගන්නා ද්‍රව්‍යයකි.

11. පහත දී ඇති ඉංග්‍රීසි වාක්‍යවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා ගෙන **ඊට යටින් ඉරක් අඳින්න.**

(i) Where .................... (is / are) you going?

(ii) I .................... (want / wants) to pluck flowers.

12. පහත දී ඇති ඉංග්‍රීසි වාක්‍යවල අර්ථය **සිංහලෙන්** ලියන්න.

(i) Please think about others.

..............................................................................................

(ii) I love my country. : ..............................................................

13. පහත සඳහන් වාක්‍යයේ අර්ථය **ඉංග්‍රීසියට හරවා ඉංග්‍රීසි අකුරුවලින් ම** ලියන්න.

ඔබ සූදානම් ද? : ..............................................................

14. පහත සඳහන් **දෙමළ වචනයේ අර්ථය සිංහලෙන්** ලියන්න.

තුළම්බු : ..............................................................



[4 වැනි පිටුව බලන්න.

**15.** පහත සඳහන් වාක්‍යය **දෙමළෙන් කියන ආකාරය සිංහලෙන්** ලියන්න.

ඉර පායනවා. : ...........................................................................................

**16.** ඉමක් කොනක් නොපෙනෙන අහස, පොළොව, මහසයුර සොබාදහමේ අපූරු නිර්මාණ වේ. මොහොතින් මොහොත වෙනස් වන අහස, අපේ ජීවිතවලට සුන්දර අත්දැකීම් එකතු කරයි. අසිරිමත් අහස යන මාතෘකාව පිළිබඳ ව වාක්‍ය **තුනක්** ලියන්න. (සෑම වාක්‍යයක ම, වචන **පහකට වඩා වැඩියෙන් තිබිය යුතුයි. උක්ත / ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතුයි.**)

- ...........................................................................................
  ...........................................................................................
- ...........................................................................................
  ...........................................................................................
- ...........................................................................................
  ...........................................................................................

- **දී ඇති තිත් ඉරි මත පිළිතුරු සපයන්න.**

**17.** අකුරෙන් දී ඇති සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න.

හැටනවදහස් අනූනවය : ...........................................

**18.**


| | |
|---|---|
| 8 | 4 |
| 3 | 6 |

කොටුව තුළ ඇති ඉලක්කම් සියල්ල ම භාවිතයෙන් සෑදිය හැකි කුඩා ම සංඛ්‍යාව ලියන්න.

: ...........................................


**19.** සමාන පාද සහිත ත්‍රිකෝණාකාර පැති 4කින් පමණක් සෑදුණු ඝන වස්තුවේ නම කුමක් ද?

: ...........................................

**20.** 

මෙම රූපයේ පාට කළ කොටස දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.

: ...........................................

**21.** 

වැංකියේ සිටින මාළුවන් ගණන රෝම සංඛ්‍යාංකවලින් ලියන්න.

: ...........................................

**22.** පාසලක විවිධ ප්‍රසංගයක් පැය 11:30ට ආරම්භ වී පැය 14:15ට අවසන් විය. විවිධ ප්‍රසංගය පැවැත්වුණු කාලය කොපමණ ද?

: ...........................................

**23.** (i) මෙම සංඛ්‍යා රටාවේ ඊළඟ සංඛ්‍යාව ලියන්න. 3, 12, 21, 30, ......................

(ii) පහත දී ඇති සංඛ්‍යා පිළිවෙළ අනුව, සංඛ්‍යා රටාවක් ලබා ගැනීමට ඉවත් කළ යුතු සංඛ්‍යාව කුමක් ද?

64, 46, 32, 16, 8 : ..................



[5 වැනි පිටුව බලන්න.

**24.** ත්‍යාග ප්‍රදානය කිරීමේ උත්සවයක් සඳහා පොත් 810ක් ලැබී ඇත. පාර්සලයකට පොත් 4 බැගින් ඇතුළත් වන සේ තැනිය හැකි පාර්සල් කීයක් සෑදිය හැකි ද?

:.....................................................

**25.**





රවුම තුළ ඇති සංඛ්‍යාවලින් 8හි ගුණාකාර තෝරා ලියන්න.

:.....................................................

**26.** ඉදිරියෙන් දී ඇති රූපයෙන් $\frac{1}{2}$ක් (පැන්සලෙන් හෝ පෑනෙන්) පාට කරන්න.



**27.**





(i) මෙම රූපය ඇතුළත සෘජු කෝණ කීයක් තිබේ ද?

:.....................................................

(ii) මෙම රූපයේ පරිමිතිය සොයන්න.

:.....................................................

**28.** පහත දී ඇති රූපය ඇසුරෙන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



(i) පාට කළ කොටසේ වර්ගඵලය, කොටු කීයකට සමාන වේ ද?

:.....................................................

(ii) සෑම කුඩා කොටුවක ම දිග 1 cmක් හා පළල 1 cmක් වේ. පාට **නොකළ** කොටසේ වර්ගඵලය වර්ග සෙන්ටිමීටර කීය ද?

:.....................................................

**29.** වෙළෙඳසලක තබා ඇති මිල දර්ශනයක කොටසක් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| කිරි පිටි පැකට් | 1 ක් | රු. 350.00 |
| තේ කොළ | 1 kg ක් | රු. 824.00 |
| සීනි | 1 kg ක් | රු. 95.00 |

පාසලක ප්‍රදානයට සහභාගී වූ අයට කිරි තේ ලබා දීම සඳහා, පහත සඳහන් වගුවේ දැක්වෙන පරිදි ද්‍රව්‍ය මිල දී ගනු ලැබිණි.

(i) මිල දර්ශනයට අනුව වගුවේ හිස්තැන් පුරවන්න.

| මිල දී ගත් ද්‍රව්‍යය | ප්‍රමාණය | මුදල | |
|---|---|---|---|
| | | රු. | ශත |
| කිරි පිටි | පැකට් 4 | 1 400 | 00 |
| තේ කොළ | 250 g | ...... | ...... |
| සීනි | 2 kg | ...... | ...... |
| | එකතුව | ...... | ...... |


(ii) කිරි තේ සකස් කිරීමේ දී පළමුව ලීටර 4යි මිලිලීටර 750ක් ද දෙවනුව ලීටර 3යි මිලිලීටර 450ක් ද සකස් කෙරිණි. සෑදූ මුළු කිරි තේ පරිමාව කොපමණ ද?

:.....................................................



[6 වැනි පිටුව බලන්න.

**30.** 2015 වර්ෂයේ පරිසර දිනය වෙනුවෙන්, 5 ශ්‍රේණියේ සිසුන් පිරිසක් විසින් තම පාසල් වත්තේ වගාකරන ලද, මල් පැළ වර්ග පිළිබඳ තොරතුරු මෙම ප්‍රස්තාරයේ දැක්වේ.




(i) වගාකරන ලද රෝස පැළ සංඛ්‍යාව, කපුරු පැළ සංඛ්‍යාව මෙන් දෙගුණයකි. කපුරු පැළ සංඛ්‍යාව ප්‍රස්තාරයේ ඇඳ දක්වන්න.

(ii) අඩුවෙන් ම වගාකර ඇති පැළ වර්ගයෙහි නම කුමක් ද?

: ..............................................................

(iii) වගාකරන ලද මුළු පැළ සංඛ්‍යාව කොපමණ ද?

: ..............................................................

- ප්‍රශ්න අංක **31** සිට **60** තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර, දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා ගෙන **ඊට යටින් ඉරක් අඳින්න.**

**31.** බොහෝ සුවඳවත් මලකි.
(1) සේපාලිකා (2) ඇන්තූරියම් (3) වද (4) බෝගන්විලා

**32.** වැල්වල සෑදෙන පලතුරු වර්ගයකි.
(1) නෙල්ලි (2) මිදි (3) දෙළුම් (4) දිවුල්

**33.** අතුවල මෙන් ම කඳෙහි ද ගෙඩි හට ගන්නා ශාකයකි.
(1) කොස් (2) වෙරළු (3) මැංගුස් (4) රබර්

**34.** අලංකාරය සඳහා තබන මල් බඳුනක, මල්, වැඩි දින ගණනක් හොඳින් තබා ගැනීම සඳහා මල් බඳුනේ ඇති ජලයට එකතු කිරීමට සුදුසු ද්‍රව්‍යය කුමක් ද?
(1) අසමෝදගම් (2) ඔඩිකොලොන් (3) ලුණු (4) ඇස්ප්‍රින්

**35.** ශ්‍රී ලංකාවේ ඒකදේශික ක්ෂීරපායි සතෙකි.
(1) කැහිබෙල්ලා (2) ගල්පාඩියා (3) කළු වඳුරා (4) පිඹුරා

**36.** ශක්තිය වඩවන ආහාරයකි.
(1) නිවිති (2) බෝංචි (3) බණ්ඩක්කා (4) දෙල්

**37.** මීයාගේ ඇඟේ වසන මැක්කකු මගින් බෝ වන රෝගය කුමක් ද?
(1) පාචනය (2) බරවා (3) ජලභීතිකාව (4) මහාමාරිය

**38.** වගාවලට හානි කරන ගොළුබෙල්ලන් ආහාරයට ගන්නා සතෙකි.
(1) මුගටියා (2) ඇටිකුකුළා (3) ඉත්තෑවා (4) නයා

**39.** ඇඹුල් දැමීම **නුසුදුසු** වන්නේ, පහත සඳහන් කුමන භාජනයක ආහාර සකස් කරන විට ද?
(1) මැටි භාජනයක (2) ඇලුමිනියම් භාජනයක
(3) ප්ලාස්ටික් භාජනයක (4) වීදුරු භාජනයක

**40.** මදුරුවන් අප වෙත ළං වීම වැළැක්වීම සඳහා ශරීරයේ තැවරීමට සුදුසු තෙල් වර්ගයකි.
(1) එළවලු තෙල් (2) තල තෙල් (3) පැඟිරි තෙල් (4) පොල් තෙල්

**41.** ගැඹුරු ළිඳකින් ජලය ඉහළට ගැනීම සඳහා භාවිත කෙරෙන වැඩ පහසු කිරීමේ යන්ත්‍රය කුමක් ද?
(1) ජල රෝදය (2) දැති රෝදය (3) කරාමය (4) කප්පිය



[7 වැනි පිටුව බලන්න.

**42.** 

කොට්ට උරයකට, රූපයේ දැක්වෙන පරිදි මලක් මැසීමේ දී මල්පෙති වලට යෙදිය යුතු මැස්ම කුමක් ද?

(1) දම්වැල් මැස්ම (2) නැටි මැස්ම
(3) බ්ලැන්කට් මැස්ම (4) කතිර මැස්ම

**43.** මහවැලි ගඟ මුහුදට වැටෙන ස්ථානයට ආසන්න ම නගරය කුමක් ද?

(1) ත්‍රිකුණාමලය (2) මඩකලපුව (3) මුලතිව් (4) පුත්තලම

**44.** ලී කැටයම්වලට ප්‍රසිද්ධ ස්ථානයකි.

(1) යාපහුව බලකොටුව (2) ලෝවාමහාපාය
(3) ඇම්බැක්ක දේවාලය (4) ඉසුරුමුණිය විහාරය

**45.** සියලු ම ආගමික බැතිමතුන් විසින් වැඳ පුදා ගන්නා ශ්‍රී පාද ස්ථානය පිහිටි පළාත කුමක් ද?

(1) ඌව (2) මධ්‍යම (3) නැගෙනහිර (4) සබරගමුව

**46.** ශ්‍රී ලාංකික ජනතාව විසින් නිදහස් දිනය සමරනු ලබන්නේ,

(1) ජනවාරි 01 වැනි දා ය. (2) පෙබරවාරි 04 වැනි දා ය.
(3) අප්‍රේල් 13 වැනි දා ය. (4) මැයි 01 වැනි දා ය.

**47.** ශ්‍රී ලංකාවේ ජාතික කොඩිය හා රාජ්‍ය ලාංඡනය යන දෙකෙහි ම ඇති සංකේතය කුමක් ද?

(1) පලාපෙති (2) පුන්කලස
(3) බෝ පත් (4) කඩුවක් රැගත් සිංහයා

**48.** සෑම ශ්‍රී ලංකා මුදල් නෝට්ටුවක ම ඇති පොදු ලක්ෂණයකි.

(1) පුන්කලසක රූපයක් තිබීම
(2) දිය ඇල්ලක රූපයක් තිබීම
(3) ශ්‍රී ලංකා මහ බැංකුව යන්න සටහන් කර තිබීම
(4) නෝට්ටුවේ අගය සිංහල හා දෙමළ භාෂාවලින් පමණක් සටහන් කර තිබීම

**49.** ඔලිම්පික් කොඩියේ ඇති රවුම්වල වර්ණ තුනක් සඳහන් පිළිතුර තෝරන්න.

(1) රතු, නිල්, කහ (2) රතු, කළු, දම් (3) කළු, කොළ, දුඹුරු (4) නිල්, සුදු, රතු

**50.** ආහාර ගැනීම සම්බන්ධ ව අප තුළ තිබිය යුතු හොඳ පුරුද්දකි.

(1) ක්ෂණික ආහාර නිතර භාවිතය
(2) පැණි රස ආහාර වැඩිපුර අනුභව කිරීම
(3) ප්‍රධාන ආහාර වේල් සඳහා පලා වර්ගයක් එකතු කර ගැනීම
(4) විවේකයක් ලැබෙන සෑම විට ම ආහාර අනුභව කිරීම

**51.** ආපණ ශාලාවක තබා ඇති, රූපයේ දැක්වෙන (1) සහ (2) භාජනවලට දැමීමට සුදුසු ද්‍රව්‍ය 2ක් **පිළිවෙළින්** දැක්වෙන පිළිතුර තෝරන්න.


(1) කෙසෙල් ලෙලි, කඩදාසි
(2) ඉතිරි වූ ආහාර, කඩදාසි
(3) කඩදාසි, යෝගට් කෝප්ප
(4) යෝගට් කෝප්ප, ප්ලාස්ටික් මූඩි





**52.** 'පළල් මාර්ගය' පෙන්නුම් කිරීමට භාවිත කෙරෙන රූපික ප්‍රකාශනය කුමක් ද?


(1)


(2)


(3)




(4)



[8 වැනි පිටුව බලන්න.

53. ඉවත දමන වැහිපිහිලි කැබැල්ලක් බෝග වගාවට යොදා ගෙන ඇති ආකාරය රූපයේ දැක්වේ. මෙම විකල්ප ක්‍රමය පිළිබඳ ව පහත සඳහන් කුමක් නිවැරදි ද?



(1) සාත්තු කිරීම අපහසු ය.
(2) එක ම ස්ථානයක තබා වගා කළ යුතු ය.
(3) සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීම අපහසු ය.
(4) ඉඩකඩ සීමා වූ තැන්වල බෝග වගාවට සුදුසු ය.


54. තොරතුරු සජීව ලෙස ද අපට ලබා දෙන මාධ්‍යයකි.

(1) පුවත්පත (2) අත් පත්‍රිකා (3) රූපවාහිනිය (4) දැන්වීම

55. තැපැල් පෙට්ටියක සටහන් කර ඇති දෙයකි.

(1) විවෘත කරන්නාගේ නම
(2) ලිපියකට තිබිය හැකි වැඩි ම බර
(3) ලිපි ගන්නා වේලාව
(4) ලිපි ගන්නා දිනය

56. A හා B කුඩා වීදුරු දෙකට, නිරෝගී මුං බීජ සමාන ප්‍රමාණ දමා ඇති අතර බීජ හොඳින් වැසෙන පරිදි A වීදුරුවේ ජලය දමා ඇත. B වීදුරුවේ බීජ තෙත පුළුන් මත තැන්පත් කර ඇත. එම වීදුරු දෙක හිරු එළිය ඇති ස්ථානයක තබා, දින කිහිපයකින් පරීක්ෂා කළ විට ලැබෙන නිරීක්ෂණය කුමක් විය හැකි ද?




(1) A වීදුරුවෙහි බීජ හොඳින් පැළ වේ.
(2) B වීදුරුවෙහි බීජ හොඳින් පැළ වේ.
(3) A හා B වීදුරු දෙකෙහි ම බීජ හොඳින් පැළ වේ.
(4) A හා B වීදුරු දෙකෙහි ම බීජ පැළ නො වේ.

57. විදුලි බුබුළ නිපදවීමේ ගෞරවය හිමි වන්නේ,

(1) ජෝන් ලොගී බෙයාර්ඩ් මහතාට ය.
(2) තෝමස් අල්වා එඩිසන් මහතාට ය.
(3) ආතර් සී. ක්ලාක් මහතාට ය.
(4) ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම් බෙල් මහතාට ය.

58. අනතුරක් සිදු වීමට වඩාත් ම ඉඩ ඇති අවස්ථාවකි.

(1) සංඥා එළි පුවරුවක රතු පාට මීනිසා දිස්වෙමින් තිබිය දී කහ ඉරි මතින් වාහන ගමන් කිරීම
(2) අකුණු අවස්ථාවක නිවෙසක ලී ඇඳක් මත නිදාගෙන සිටීම
(3) ක්‍රීඩා උත්සවයක් අවසන් වූ විට රතිඤ්ඤා පත්තු කිරීම
(4) වියළි රබර් පාපිස්සක් මත සිටගෙන විදුලි ඉස්තිරික්කයෙන් ඇඳුම් මැදීම

59. පුද්ගලයකුගේ පාදයකට සර්පයකු දෂ්ට කර ඇති අවස්ථාවක, එම පුද්ගලයාට ප්‍රථමාධාර ලබා දීමේ දී මුලින් ම කළ යුතු වන්නේ,

(1) සර්පයා සොයා හඳුනා ගැනීම ය.
(2) දෂ්ට කළ ස්ථානය පිරිසිදු ඇල් ජලයෙන් සේදීම ය.
(3) වෙළුම් පටි මගින් පාද දෙක ගැට ගසා නොසොලවා තැබීම ය.
(4) උණු පානයක් ලබා දීම ය.

60. "මම මගෙන් ඉටු විය යුතු යුතුකම් නිවසටත්, පාසලටත්, රටටත් ඉටු කරන දරුවෙක් වෙමි."
මෙසේ සිතීම, සිත් පහන් කිරීමේ ක්‍රියාකාරකමක කී වැනි පියවරට අයත් වේ ද?

(1) පළමුවැනි (2) දෙවැනි (3) හතරවැනි (4) පස්වැනි



***

# I පත්‍රය

## ලකුණු දීමේ පටිපාටිය



**විශේෂ උපදෙස් :**

ප්‍රශ්නවල නිවැරදි පිළිතුරට හිමි අංකය හෝ පිළිතුරේ කොටසක් හෝ යටින් ඉරක් ඇඳ හෝ රවුම් කර හෝ සලකුණු කර ඇති විට එය නිවැරදි පිළිතුරක් ලෙස සලකන්න. පිළිතුර ලියා තිබීම නිවැරදි සේ **නොසැලකේ.**

| ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | පිළිතුර |
|---|---|---|
| 1 | (2) |  |
| 2 | (1) |  |
| 3 | (3) | වවුලා |
| 4 | (1) | කොට්ටෝරුවා, දිමියා |
| 5 | (3) |   |
| 6 | (1) | △ ▲ □ |
| 7 | (2) | මාළුවා ඇම ගිලිවී. |
| 8 | (3) | කමත |
| 9 | (2) | ඉදිකටුව - නූල |
| 10 | (1) | 456 |
| 11 | (3) | 3, 4 |
| 12 | (2) | △□✱◆ |
| 13 | (3) | ○[illegible]●▲ |
| 14 | (2) | b |





[4 වැනි පිටුව බලන්න.

| ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | පිළිතුර |
|---|---|---|
| 15 | (1) |  |
| 16 | (3) |  |
| 17 | (3) |  |
| 18 | (1) |  |
| 19 | (2) | 4 |
| 20 | (2) | 19 |
| 21 | (1) |  |
| 22 | (1) | රු. 2400 හා රු. 1300 ය. |
| 23 | (3) | 17 |
| 24 | (2) | රු. 12 |
| 25 | (3) | අනුරාධපුරය, අම්පාර |
| 26 | (2) | ප.ව. 12.15 |
| 27 | (3) | දුන්හිඳ, ලක්ෂපාන |
| 28 | (3) | 12 කි. |
| 29 | (2) | 2028 |



[5 වැනි පිටුව බලන්න.

| ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | පිළිතුර |
|---|---|---|
| 30 | (1) |  |
| 31 | (1) | ගුණදාස මගේ සීයා ය. |
| 32 | (1) | 2 |
| 33 | (1) | මිනිත්තු 45 යි. |
| 34 | (1) |  |
| 35 | (3) | 14 |
| 36 | (2) | සෘජුකෝණාස්‍ර ගණන, වෘත්ත ගණන මෙන් දෙගුණයක් වේ. |
| 37 | (1) | 8 |
| 38 | (1) | 16, 48 |
| 39 | (2) | 60 |
| 40 | (3) | රතු, හැඹිලි |

# II පත්‍රය
## ලකුණු දීමේ පටිපාටිය

| ප්‍රශ්න අංක | | පිළිතුරු | ලකුණු |
|---|---|---|---|
| 1 | (i) | වනය / වන ගැබ / වනය ගැන / වන ගැබ ගැන / වනයක් ගැන / වන ගැබක් ගැන / වනය පිළිබඳ ව / වන ගැබ පිළිබඳ ව / වනයක් පිළිබඳ ව / වන ගැබක් පිළිබඳ ව | 01 |
| | (ii) | එකිනෙක ගැටීමෙන් / වියළි අතු එකිනෙක ගැටීමෙන් / අතු එකිනෙක ගැටීමෙන් | 01 |
| | (iii) | සත්තු / වන සත්තු | 01 |
| | (iv) | ගියාට | 01 |
| | (v) | ඔබ මොබ | 01 |
| | (vi) | සේයාවන් මෙන් | 01 |
| 2 | (i) | විකාශන | 01 |
| | (ii) | ඇසිණි | 01 |
| 3 | (i) | යමු | 01 |
| | (ii) | කළෝ ය | 01 |
| | (iii) | පැමිණියා ය | 01 |
| 4 | (i) | වතුර මල | 01 |
| | (ii) | අලුත් | 01 |
| 5 | | නැතියෙත් නුඹ වැනි දහසක් | 01 |
| 6 | | කීකරු වීම / කීකරුකම / කීකරු බව / සැමටම කීකරු වීම / මව්පියන්ට, ගුරුවරුන්ට, නෑදෑයින්ට, සොහොයුරන්ට කීකරු වීම | 01 |
| 7 | | නොතෙමෙයි | 01 |
| 8 | | මෝය | 01 |
| 9 | | මිනිසා හා පරිසරය අතර තිබෙන්නේ ඉතා සමීප සම්බන්ධයකි / පරිසරය හා මිනිසා අතර තිබෙන්නේ ඉතා සමීප සම්බන්ධයකි | 01 |
| 10 | | (එක් එක් නිවැරදි වචනය සඳහා ලකුණු 01 බැගින්) | 03 |

| | | | |
|---|---|---|---|
| | 1 අ | 2 මි | ල |
| | | නි | |
| 3 උ | තු | ර | |
| | | න් | |

| ප්‍රශ්න අංක | | පිළිතුරු | ලකුණු |
|---|---|---|---|
| 11 | (i) | are | 01 |
| | (ii) | want | 01 |



[5 වැනි පිටුව බලන්න.

| ප්‍රශ්න අංක | | පිළිතුරු | ලකුණු |
|---|---|---|---|
| 12 | (i) | කරුණාකර අනෙක් අය ගැන හිතන්න / කරුණාකර අනෙක් අය ගැනත් හිතන්න / අනෙක් අය ගැනත් කරුණාකර හිතන්න / කරුණාකර අන් අය ගැනත් හිතන්න / කරුණාකර අන් අය ගැන ද හිතන්න (හිතන්න වෙනුවට සිතන්න ලෙස ලියා තිබුණත් ලකුණු දෙන්න.) | 01 |
| | (ii) | මම මගේ රටට ආදරය කරමි. / මගේ රටට මම ආදරය කරමි. / මම මගේ රටට ආදරෙයි./ මගේ රටට මම ආදරෙයි. / මං මගේ රටට ආදරෙයි. / මගේ රටට මං ආදරෙයි. | 01 |
| 13 | | Are you ready?<br>ARE YOU READY? (ප්‍රශ්නාර්ථ ලකුණ නොසලකා ලකුණු ලබා දෙන්න.) | 01 |
| 14 | | මදුරුවා | 01 |
| 15 | | සූරියන් උදික්කිරදු | 01 |
| 16 | | නිවැරදි වාක්‍ය 03 සඳහා ලකුණු 02 × 03<br>**එක් නිවැරදි වැකියකට ලකුණු 02 බැගින් ලැබේ.**<br>* දී ඇති මාතෘකාවකට අනුව ලියන ලද වැකි විය යුතු ය.<br>* උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි විය යුතු ය.<br>* ලිඛිත භාෂාවෙන් ලියන ලද වැකි විය යුතු ය.<br>* වැකියක වචන ගණන පහට වැඩි විය යුතු ය.<br>* අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු ය.<br>* වැකියේ අදහස නිවැරදි විය යුතු ය.<br>* මාතෘකාවේ සඳහන් කොටස් නැවත නැවත ලිවීම හෝ එක ම අදහස නැවත නැවත ලිවීම සිදු නොවිය යුතු ය.<br>* මාතෘකාවට දී ඇති වාක්‍යය ම උපුටා ඇත්නම් ලකුණු දෙනු නොලැබේ.<br>[වැකියේ එක් වචනයක අකුරක අඩුපාඩුවක් හෝ පිල්ලමක අඩුවක් හෝ වේ නම් ලකුණු 01 කි. (එකට වැඩි අඩුපාඩු වේ නම් ලකුණු නොලැබේ.)]<br>වැකි තුනකට වඩා ලියා ඇත්නම් මුල් වැකි 03 (තුන) පමණක් ලකුණු කරන්න. (වැඩිපුර ලියා ඇත්නම් රතු පාට ඉරකින් කපා හරින්න.) | 06 |
| 17 | | 69 099 | 02 |
| 18 | | 3 468 | 02 |
| 19 | | චතුස්තලය | 02 |
| 20 | | 0·6 | 02 |
| 21 | | ix / IX / lX | 02 |
| 22 | | පැය 2 මිනිත්තු 45 / පැය 2 විනාඩි 45 / පැය $2\frac{3}{4}$ /<br>පැය දෙකයි මිනිත්තු හතළිස් පහයි / පැය දෙකයි විනාඩි හතළිස් පහයි / | 02 |
| 23 | (i) | 39 | 01 |
| | (ii) | 46 | 01 |
| 24 | | 202 යි | 02 |
| 25 | | 56, 72 (පිළිතුරු තුනක් ලියා ඇත්නම් ලකුණු 00 යි) | 01 + 01 |



[6 වැනි පිටුව බලන්න.

| ප්‍රශ්න අංක | | පිළිතුරු | ලකුණු |
|---|---|---|---|
| 26 | |  | 02 |
| 27 | (i) | 6 / හයයි | 01 |
| | (ii) | 10 m / මීටර 10 | 01 |
| 28 | (i) | 6 / හයයි | 02 |
| | (ii) | 9 / 9 $cm^2$ / වර්ග සෙන්ටිමීටර 9<br>නවයයි / වර්ග සෙන්ටිමීටර නවයයි | 02 |
| 29 | (i) | 1400.00 | |
| | | 206.00 | 01 |
| | | 190.00 | 01 |
| | | 1796.00 | 01 |
| | (ii) | 8 *l* 200 m*l* / ලීටර 8යි මිලි ලීටර 200 යි<br>8200 m*l*/මිලි ලීටර 8200 යි / ලීටර අටයි මිලි ලීටර දෙසියයි / මිලි ලීටර අටදහස් දෙසියයි | 01 |
| 30 | (i) | නිවැරදි ව ප්‍රස්තාරයේ ඇඳීම (ස්ථම්භය ඇඳීම සිදු කර තිබුණේ නැතත්, 20 හඳුනා ගෙන ඇත්නම් ලකුණු 01 ක් දෙන්න.) | 02 |
| | (ii) | පිච්ච | 01 |
| | (iii) | 100 / සියයයි | 01 |
| 31 | | 1 සේපාලිකා | 01 |
| 32 | | 2 මිදි | 01 |
| 33 | | 1 කොස් | 01 |
| 34 | | 4 ඇස්ප්‍රින් | 01 |
| 35 | | 3 කළු වඳුරා | 01 |
| 36 | | 4 දෙල් | 01 |
| 37 | | 4 මහාමාරිය | 01 |
| 38 | | 2 ඇටි කුකුළා | 01 |
| 39 | | 2 ඇලුමිනියම් භාජනයක | 01 |
| 40 | | 3 පැඟිරි තෙල් | 01 |



[7 වැනි පිටුව බලන්න.